# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2219/35 - 2021 මාර්තු මස 16 වැනි අඟහරුවාදා - 2021.03.16

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.21/78 (xvi)(A).

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 140 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2021 මාර්තු මස 16 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 2021 අංක 01 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මෙම නියමාවලියේ විධිවිධාන යටතේ (මෙහි මින්මතු 'ආයතනය' යනුවෙන් සඳහන් කරනු ලබන) මානව සම්පත් අභිවර්ධන ආයතනය ලෙස හඳුන්වනු ලැබිය යුතු ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) මෙම ආයතනය, (මෙහි මින්මතු ''විශ්වවිද්‍යාලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත කරනු ලැබ තිබිය යුතු ය.

(3) පනතේ සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට සහ කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍යයන්ට යටත්ව, ආයතනයට පහත සඳහන් බලතල තිබිය යුතු ය :-

(අ) ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම ;

1A - PG 5348 — 175(2021/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www. documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) (i) ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි යම් අනුමත කරන ලද අධ්‍යයන ක්ෂේත්‍රවල ඉගැන්වීම් සහ පුහුණු කිරීම් සඳහා කටයුතු සැලැස්වීම.

(ii) යම් මානව සම්පත් අභිවර්ධන ක්ෂේත්‍රයක පර්යේෂණවල සහ සංවර්ධනයෙහි නියුතු වීම.

(iii) යම් මානව සම්පත් අභිවර්ධන ක්ෂේත්‍රයක උපදේශන සේවය සැපයීම ;

(ඇ) අවශ්‍ය අවස්ථාවල දී, විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමතය සහ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, මානව සම්පත් අභිවර්ධන අධ්‍යයන අංශයන්හි ප්‍රදානය කළ යුතු උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ආදිය නිශ්චය කිරීම ;

(ඈ) අනුමත කරන ලද අධ්‍යයන අංශයන්හි ප්‍රවීණත්වය ලැබූ තැනැත්තන් නිශ්චය කිරීම සඳහා, විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමතය ඇතිව, විභාග පැවැත්වීම සහ එවැනි විභාග සමත් වී ඇති සහ විශ්වවිද්‍යාලය විසින් ආයතනය විමසා සාදනු ලැබිය හැකි අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි පරිදි වෙනත් යම් කොන්දේසි සපුරා ඇති තැනැත්තන් විශ්වවිද්‍යාලයේ උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(ඉ) ආචාර්යවරුන්, ශිෂ්‍යයන් සහ ශාස්ත්‍රධරයන් හුවමාරු කර ගැනීමේ මාර්ගයෙන් හෝ අන්‍යාකාරයකින් ආයතනයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ වෙනත් විදේශයක විශ්වවිද්‍යාල හෝ ආයතන සමග සහයෝගීතාවයෙන් ක්‍රියා කිරීම ;

(ඊ) අතුරු ව්‍යවස්ථාවකින් නියම කරනු ලැබිය හැකි පරිදි, ආයතනයට ඇතුළත්වීමට අපේක්ෂා කරන තැනැත්තන් විසින් හෝ විශ්වවිද්‍යාල ආයතනයක සහ විශ්වවිද්‍යාල මට්ටමේ ඉගෙනීමේ ස්ථානවල ශිෂ්‍යයන් විසින් සමත් වූ විභාග සහ ගත කළ ඉගෙනීමේ හෝ අධ්‍යයන කාල සීමා, ආයතනය තුළ හෝ එහි යම් කොටසක් තුළ වූ යම් විභාගවලට සහ ඉගෙනීමේ හෝ අධ්‍යයන කාල සීමාවලට සමාන ලෙස පිළිගැනීම සහ ඕනෑම අවස්ථාවක ඒ පිළිගැනීම ඉවත් කර ගැනීම ;

(උ) ඉගැන්වීමේ, පුහුණු කිරීමේ, පර්යේෂණ සහ සංවර්ධන සහ උපදේශන කාර්ය සඳහා ආයතනයේ කාර්ය සඳහා පුස්තකාල, විද්‍යාගාර සහ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම සහ ඒවා පවත්වාගෙන යාම ;

(ඌ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි පරිදි වූ පරිපාලන තනතුරු ඇතුළු ජ්‍යෙෂ්ඨ මහාචාර්යධුර, මහාචාර්යධුර, සහාය මහාචාර්යධුර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යධුර, කථිකාචාර්යධුර සහ වෙනත් තනතුරු ඇති කිරීම, අවලංගු කිරීම හෝ අත්හිටුවීම සඳහා විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(එ) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග ඇති කිරීම සහ ප්‍රදානය කිරීම ;

(ඒ) යම් අතුරු ව්‍යවස්ථාවකට අනුකූලව ආයතනය තුළ සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන තුළ පාඨමාලා හෝ පාඨමාලාවල කොටස් පැවැත්වීම සඳහා වැඩපිළිවෙළ සැකසීම ;

(ඔ) යම් රීතියකට අනුකූලව ගාස්තු ඉල්ලා සිටීම සහ භාරගැනීම ; සහ

(ඕ) ආයතනයේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකි ඉහත නිශ්චිතව දක්වා ඇති බලතලවලට ආනුෂංගික වූ වෙනත් යම් ක්‍රියා හෝ දේවල් සිදු කිරීම.

4. ආයතනයේ නිලධරයන් විය යුත්තේ -

(i) අධ්‍යක්ෂවරයා ; සහ

(ii) මේ ඡේදයේ කාර්යය සඳහා නිලධරයකු වන, නියමාවලිය මගින් තනතුරක් විය යුතු බවට ප්‍රකාශ කරනු ලබන වෙනත් යම් තනතුරක් දරන්නකු,

5. (1) ප්‍රථම අධ්‍යක්ෂවරයා විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් පත්කරනු ලැබිය යුතු ය. ඊට පසුව පත් වන සෑම අධ්‍යක්ෂවරයෙක්ම ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් නම් කරනු ලබන, විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් නිර්දේශ කරන තැනැත්තන් තිදෙනෙකුගෙන් සමන්විත මූල මණ්ඩලයකින්, විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද, කිසිම තැනැත්තකු අනුක්‍රමික වාර දෙකකට වඩා වැඩි වාර ගණනක් සඳහා ආයතනයේ අධ්‍යක්ෂවරයකු ලෙස පත්කරනු නොලැබිය යුතු ය.

(2) උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු අධ්‍යක්ෂවරයා ලෙස පත්කරනු ලබන අවස්ථාවක, ඒ ආයතනය විසින් කාර්ය මණ්ඩලයේ ඒ සාමාජිකයා අධ්‍යක්ෂ තනතුර භාර ගැනීම සඳහා මුදහැරිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයා, කලින් සිය ධුරය අත්හැරියහොත් හෝ (4) වන උප නියමාවලිය යටතේ ධුරයෙන් ඉවත් කර ඇත්නම් මිස, සිය පත්වීමේ දින සිට ගණන් ගැනෙන වසර තුනක කාල සීමාවක් සඳහා හෝ ඔහු වයස අවුරුදු හැට පහ සම්පූර්ණ කරන තෙක් යන අවස්ථා දෙකෙන් කලින් එළඹෙන අවස්ථාව තෙක් ධුරය දැරිය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයා, විශ්වාසභංග යෝජනාවක් සම්මත කර ගැනීමේ කාර්යය සඳහා කැඳවන ලද විශේෂ රැස්වීමක දී, කළමනාකරණ මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකින් සම්මත කර ගනු ලැබූ විශ්වාසභංග යෝජනාවක් මගින් විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. එවැනි විශේෂ රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයන් එම රැස්වීමේ මුලසුන දැරීමට අධ්‍යක්ෂවරයා නොවන තැනැත්තකු ඔවුන් අතරින් තෝරාපත් කරගනු ලැබිය යුතු ය.

(5) ධුරයෙන් ඉල්ලා අස්වන හෝ ඉවත්කරන ලද අධ්‍යක්ෂවරයා හට, අධ්‍යක්ෂවරයකු ලෙස ඔහුගේ පත්වීමට පෙරාතුවම ඔහු උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුව සිටියේ නම් සහ ඔහු වයස අවුරුදු හැට පහ සම්පූර්ණ කර නොමැත්තේ නම්, ඒ උසස් අධ්‍යාපන ආයතනයේ නිත්‍ය තනතුරට නැවත පත්විය හැකි ය.

(6) අධ්‍යක්ෂවරයකු, නිවාඩු ලබා සිටීම, අසනීප වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනයම් හේතුවක් මත ඔහුගේ ධුරයේ කටයුතු කිරීමට තාවකාලිකව අපොහොසත් වේ නම්, විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින්, 8 වන නියමාවලියේ (ආ) හෝ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් අතරින් සාමාජිකයකු ඒ සඳහා පත් කරනු ලැබිය යුතු ය.

(7) අධ්‍යක්ෂ ධුරයේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින්, (1) වන උප නියමාවලිය යටතේ ස්ථිර පත්වීමක් සිදුකරනු ලබන තෙක්, 8 වන නියමාවලියේ (ආ) හෝ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් අතරින් සාමාජිකයකු ඒ සඳහා පත් කරනු ලැබිය යුතු ය.

6. (1) අධ්‍යක්ෂවරයා ආයතනයේ පූර්ණකාලීන නිලධරයකු විය යුතු අතර, එහි අධ්‍යයන සහ පරිපාලන ප්‍රධානයා විය යුතු ය. ඔහු කළමනාකරණ මණ්ඩලයේ සහ අධ්‍යයන සමායෝජන කමිටුවේ නිලබලයෙන් පත් වූ සාමාජිකයකු සහ සභාපතිවරයා වන අතර, එක් එක් අධ්‍යයන සභාවල නිලබලයෙන් පත් වූ සාමාජිකයෙක් විය යුතු ය. ආයතනයේ වෙනත් යම් අධිකාරයක හෝ මණ්ඩලයක යම් රැස්වීමකට පැමිණ සහභාගිවීමට සහ ඇමතීමට හිමිකම් ඇති නමුත්, ඔහු එවැනි අධිකාරයක හෝ මණ්ඩලයක සාමාජිකයකු වේ නම් මිස, එවැනි යම් රැස්වීමක දී ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් නොලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා විසින්, විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් තත්කාර්ය සඳහා තමා වෙත, කලින් කල නිකුත් කරනු ලැබිය හැකි යම් නියෝගවලට අනුකූලව, පනතේ සහ යම් කිසි සාධන පත්‍රයක විධිවිධාන, ඒවා ආයතනයට අදාළ වනතාක් දුරට, යථා පරිදි පිළිපදිනු ලැබ ඇති බවට සහතික විය යුතු ය. තත්කාර්ය සඳහා ඔහු විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි සියලු බලතල ඔහුට ඇති අතර, ඔහු විසින් ඒ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(3) කළමනාකරණ මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කෙරෙන බවට වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය.

(4) අධ්‍යක්ෂවරයා ආයතනයේ ගණන්දීමේ නිලධරයා විය යුතු ය.

(5) අධ්‍යක්ෂවරයා, ආයතනය තුළ විනය පවත්වාගෙන යාම සඳහා වගකිව යුතු ය. ශිෂ්‍යයන්ගේ විනය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සුදුසු කාලවලදී සහ අවස්ථාවල දී අධ්‍යක්ෂවරයා විසින් පාලක සභාවේ උපදෙස් ඉල්ලා සිටිය හැකි ය. අධ්‍යක්ෂවරයා විසින් විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ එකඟත්වය ඇතිව ආචාර්යවරුන්ගේ සහ වෙනත් සේවකයන්ගේ ද විනය පවත්වාගෙන යා යුතු ය.

7. ආයතනයේ අධිකාරීන් පහත සඳහන් පරිදි විය යුතු ය :-

(i) කළමනාකරණ මණ්ඩලය ;

(ii) අධ්‍යයන සමායෝජන කමිටුව ;

(iii) අධ්‍යයන සභාව හෝ සභා ; සහ

(iv) යම් අධිකාරී බවට නියමාවලිය මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් මණ්ඩල.

8. කළමනාකරණ මණ්ඩලය ආයතනයේ විධායක සහ පරිපාලන අධිකාරිය විය යුතු අතර, එය පහත තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් නම් කරනු ලබන, විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර, අධ්‍යාපන, කළමනාකරණ සහ විද්‍යා යන පීඨවල පීඨාධිපතිවරුන් අතුරින් පීඨාධිපතිවරු තිදෙනෙක් ;

(ඇ) අධ්‍යයන සමායෝජන කමිටුවෙන් නම් කරනු ලබන කමිටුවේ සාමාජිකයන් දෙදෙනෙක්, ඉන් එක් අයකු අධ්‍යයන සභාවක සභාපතිවරයා විය යුතු ය. අනෙක් තැනැත්තා විශ්වවිද්‍යාලයේ සනාථන සභාව විසින් අධ්‍යයන සමායෝජන කමිටුවට නම් කරනු ලබන සාමාජිකයකු විය යුතු ය ;

(ඈ) අධ්‍යාපනික, වෘත්තීයමය, වාණිජ, කාර්මික, විද්‍යාත්මක හෝ පරිපාලන ක්ෂේත්‍රවල විශිෂ්ට සේවාවක් කොට ඇති තැනැත්තන් අතරින් කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සාමාජිකයන් හත්දෙනෙකු, ඉන් එක් සාමාජිකයකු මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කොමිෂන් සභාවට එවන ලද නාමයෝජනා අතරින් කොමිෂන් සභාව විසින් තෝරාපත් කරගනු ලැබිය යුතු ය.

9. (1) අධ්‍යක්ෂවරයා, කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අතර, කළමනාකරණ මණ්ඩලයේ සියලු රැස්වීම්වල ඔහු මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමක මුලසුන දැරීමට අධ්‍යක්ෂවරයා අපොහොසත් වන අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ රැස්වීමේ මුලසුන දැරීමට ඔවුන් අතරින් යම් සාමාජිකයකු තෝරා පත්කරගනු ලැබිය යුතු ය.

(2) පත් කරනු ලැබූ හෝ තෝරා පත් කරනු ලැබූ යම් සාමාජිකයකු, කලින් ධුරය අත්හැරියහොත් මිස, ඔහුගේ පත්වීමේ දින සිට ගණන් ගැනෙන වසර තුනක කාල සීමාවක් සඳහා ධුර දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත්කරනු ලැබුයේ නම් මිස, නැවත පත් කිරීම සඳහා සුදුසු විය යුතු ය ;

එසේ වුව ද, පත් කරනු ලැබූ හෝ තෝරාපත් කරනු ලැබූ යම් සාමාජිකයකු විසින් ඔහුගේ කාලසීමාව ඉකුත්වීමට පෙරාතුව ස්වකීය ධුරය අත්හරිනු ලැබුවහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින්, කලින් ස්වකීය ධුරය අත්හරිනු ලැබ ඇත්නම් මිස, තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුර දැරිය යුතු ය.

(3) කළමනාකරණ මණ්ඩලයේ පත් කරනු ලැබූ හෝ තෝරාපත් කරනු ලැබූ යම් සාමාජිකයකුට, අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ අධ්‍යක්ෂවරයා වෙත යොමුකරන ලද ලිඛිත සන්නිවේදනයක් මගින් ඔහුගේ ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) නිවාඩු ලබා නොගෙන කළමනාකරණ මණ්ඩලයේ අනුක්‍රමික රැස්වීම් තුනකට සහභාගීවීමට අපොහොසත් වන, කළමනාකරණ මණ්ඩලයේ පත් කරනු ලැබූ හෝ තෝරා පත් කරනු ලැබූ යම් සාමාජිකයකු, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස සිය ධුරය අත්හැර ඇති ලෙසට සලකනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාව විසින් 8 වන නියමාවලියේ (ඈ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති සාමාජිකයන් අතරින් ඒ පුරප්පාඩුව පිරවීමට තැනැත්තකු තෝරා පත්කර ගනු ලැබිය යුතු ය.

(5) කළමනාකරණ මණ්ඩලය විසින් යම් විශේෂිත කාර්යයක් සඳහා යම් විශේෂිත කාල සීමාවක් වෙනුවෙන් යම් තැනැත්තකු කළමනාකරණ මණ්ඩලයට සමාග්‍රහණය කර ගනු ලැබිය හැකි ය. එවැනි තැනැත්තෙකුට කළමනාකරණ මණ්ඩලයේ යම් රැස්වීමක දී ඡන්දයක් සඳහා ඉදිරිපත්වීමට හෝ ඡන්දය ප්‍රකාශ කිරීමට අයිතිවාසිකමක් නොතිබිය යුතු ය.

(6) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ට, මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ යම් පාරිශ්‍රමික හෝ දීමනා ගෙවනු ලැබිය යුතු ය.

(7) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීමක ගණපූර්ණය එහි සමස්ත සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(8) කළමනාකරණ මණ්ඩලය, අවශ්‍ය ඕනෑම අවස්ථාවක රැස්විය හැකි වුව ද, එක් එක් වර්ෂය සඳහා වාර අටකට නොඅඩු අවස්ථා ගණනක දී රැස් විය යුතු ය.

(9) අධ්‍යක්ෂවරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන ඕනෑම අවස්ථාවක හෝ, කළමනාකරණ මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සංඛ්‍යාවකින් ලිඛිත ඉල්ලීමක් ඔහු වෙත ලැබුන පසු ඔහු විසින් සතියක් ඇතුළත කළමනාකරණ මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

10. (1) පනතේ, මෙම නියමාවලියේ සහ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, ආයතනයේ ඉගැන්වීම්, අධ්‍යාපනය, විභාග, පුහුණු කිරීම් සහ පර්යේෂණ සහ සංවර්ධන සහ උපදේශක සේවා පිළිබඳ පාලනය සහ සාමාන්‍ය විධානය කළමනාකරණ මණ්ඩලය සතු විය යුතු ය.

(2) (1) වන උපනියමාවලිය මගින් එයට පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, කළමනාකරණ මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම කළ යුතු ය :-

(අ) ආයතනයේ දේපළ සහ අරමුදල් දැරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම ;

(ආ) පනතේ සහ යම් උචිත සාධනපත්‍රයක විධිවිධානවලට අනුකූලව ආයතනයට අදාළ වන සියලු කාරණා නියාමනය කිරීම සහ නිශ්චය කිරීම ;

(ඇ) යම් විශේෂිත කාර්යයක් සඳහා ආයතනයේ අභිමතය පරිදි වෙන්කළ යම් අරමුදල් පාලනය කිරීම ;

(ඈ) කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, ආයතනයට රික්තවර්ණ, පරිත්‍යාග සහ ප්‍රදාන භාරගැනීම සහ පිළිගැනීම ;

(ඉ) ආයතනයේ වාර්ෂික ගිණුම් සහ වාර්ෂික වාර්තා සලකා බැලීම සහ එම වාර්තා සහ ගිණුම් විශ්වවිද්‍යාලයේ පාලක සභාවට සහ කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම ;

(ඊ) ආයතනයේ වාර්ෂික මූල්‍ය ඇස්තමේන්තු සකස් කිරීම සහ ඒවායේ අනුමතයෙන් පසු ඒ ඇස්තමේන්තු විශ්වවිද්‍යාලයේ පාලක සභාවට සහ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(උ) ආයතනය විසින් සිදු කරනු ලබන අධ්‍යයන පාඨමාලා පැවැත්වීම, උපදේශක සේවා, පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සහ රාජ්‍ය පෞද්ගලික හවුල් ක්‍රියාකාරකම් සඳහා ගාස්තු ඉල්ලා සිටීම සහ ලබා ගැනීම ;

(ඌ) අනුමත අධ්‍යයන අංශයන්හි ප්‍රදානය කළ යුතු උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා සහ හැදෑරිය යුතු අධ්‍යයන පාඨමාලා සහ පුහුණුවීම්, ඒ උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා සඳහා සුදුසුකම් ලැබීමට අරමුණු කරන ශිෂ්‍යයන් විසින් සමත්විය යුතු විභාග සහ සපුරාලිය යුතු වෙනත් කොන්දේසි පිළිබඳව, අධ්‍යයන සමායෝජන කමිටුව විමසා විශ්වවිද්‍යාල සනාථන සභාවට නිර්දේශ කිරීම ;

(එ) අධ්‍යයන සමායෝජන කමිටුව විමසා, අධ්‍යයන පාඨමාලා සහ විභාගවලට අදාළ අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කර ඒවා පැනවීම සඳහා විශ්වවිද්‍යාල සනාථන සභාවට භාර දීම ;

(ඒ) අධ්‍යයන සමායෝජන කමිටුවේ වාර්තා සලකා බැලීමෙන් පසුව අධ්‍යයන පාඨමාලාවලට සහ විභාගවලට අදාළ නියෝග කෙටුම්පත් කිරීම සහ ඒවා පැනවීම සඳහා විශ්වවිද්‍යාල සනාථන සභාවට භාරදීම ;

(ඔ) රීති සෑදීමට බලය දෙනු ලබන යම් කාරණා සම්බන්ධයෙන් රීති කෙටුම්පත් කිරීම සහ ඒවා පැනවීම සඳහා අවස්ථානුකූලව විශ්වවිද්‍යාලයේ සනාථන සභාවට හෝ පාලක සභාවට භාරදීම :

එසේ වුව ද, අධ්‍යයන කාරණාවලට, විභාගවලට සහ පර්යේෂණවලට අදාළ රීති, අධ්‍යයන සමායෝජන කමිටුව විමසා සහ එම කමිටුවේ වාර්තා සැලකිල්ලට ගනිමින් කෙටුම්පත් කළ යුතු ය ;

(ඕ) ආයතනයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කරන ගොඩනැගිලි, පරිශ්‍ර, ගෘහභාණ්ඩ, උපකරණ සහ වෙනත් ද්‍රව්‍ය සැපයීම ;

(ක) ආයතනයේ සේවා නියුක්තයන්ගේ සේවය අත්හිටුවීම, ඔවුන් සේවයෙන් පහ කිරීම හෝ අන්‍යාකාරයකින් දඬුවම් කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ පාලක සභාවට නිර්දේශ කිරීම ;

(ග) ආයතනයේ ආචාර්යවරු සහ පරීක්ෂකවරයන් ලෙස පිළිගැනීම සඳහා සුදුසු යම් තැනැත්තන් විශ්වවිද්‍යාලයේ පාලක සභාවට නිර්දේශ කිරීම ;

(ච) අධ්‍යයන සමායෝජන කමිටුවේ වාර්තා සලකා බැලීමෙන් පසුව සහ පාලක සභාවේ අනුමතය ඇතිව :-

(i) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි පරිදි වූ ජ්‍යෙෂ්ඨ මහාචාර්යධුර, මහාචාර්යධුර, සහාය මහාචාර්යධුර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යධුර, කථිකාචාර්යධුර සහ පරිපාලනමය තනතුරු ඇතුළු වෙනත් තනතුරු ඇති කිරීම, අවලංගු කිරීම හෝ අත්හිටුවීම ;සහ

(ii) ආයතනයට පත් කරනු ලැබිය යුතු ආචාර්යවරු, නිලධරයන් සහ වෙනත් සේවකයන්ගේ සුදුසුකම් ;

(iii) අධ්‍යයන සභා ප්‍රතිසංවිධානය කිරීමේ සහ අලුත් අධ්‍යයන සභා සංවිධානය කිරීමේ පටිපාටි ;

(iv) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා වන පටිපාටි සහ කොන්දේසි,

කොමිෂන් සභාවට නිර්දේශ කිරීම ;

(ඡ) අවශ්‍ය යයි සලකනු ලබන ස්ථාවර කමිටු හෝ තත්කාර්ය කමිටු සංඛ්‍යාවක් පත්කිරීම, ඒවායේ විෂය පථය නියම කිරීම, ඒවායේ වාර්තා සලකා බැලීම සහ වෙනස් කිරීම් සහිතව හෝ රහිතව එම වාර්තා අනුමත කිරීම හෝ ඒ වාර්තා ප්‍රතික්ෂේප කිරීම ;

(ට) අධ්‍යයන සමායෝජන කමිටුව විමසා සහ විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ සහ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව අධ්‍යයන පාඨමාලාවලට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා වූ අවශ්‍යතා නිශ්චය කිරීම ;

(ඩ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් කාරණයක් සඳහා යොදා නොගත් යම් ආදායමක් ඇතුළුව ආයතනයට අයත්වන යම් මුදල් ආයෝජනය කිරීම ;

(ණ) මේ නියමාවලියෙහි හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක, ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් විධිවිධාන සලසා නොමැති, ආයතනයේ වෙනත් සියලු බලතල ක්‍රියාත්මක කිරීම :

එසේ වුව ද, කළමනාකරණ මණ්ඩලය විසින්, යම් අධ්‍යයන කාරණාවකට අදාළවන යම් යෝජනා සම්මතයක් සම්බන්ධයෙන් අධ්‍යයන සමායෝජන කමිටුවේ මතය පළමුවෙන් කළමනාකරණ මණ්ඩලයට වාර්තා කිරීමට සහ සම්ප්‍රේෂණය කිරීමට අවස්ථාවක් ලබා දී ඇත්නම් මිස එවැනි යෝජනා සම්මතයක් සම්මත නොකළ යුතු ය.

එසේම තවදුරටත් එසේ සම්මත වූ යම් යෝජනා සම්මතයක් විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ හෝ සනාථන සභාවේ එකඟත්වය ලබා ගැනීමෙන් පසුව මිස ක්‍රියාත්මක නොකළ යුතු ය.

මේ ඡේදයේ "අධ්‍යයන කාරණා" යන්නෙන් අධ්‍යයන සමායෝජන කමිටුවේ පාලනය සහ සාමාන්‍ය විධානයට යටත් වන්නාවූ යම් කාරණාවක් අදහස් වන්නේ ය.

11. (1) පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත අධ්‍යයන සමායෝජන කමිටුවක් තිබිය යුතු ය :-

(අ) සභාපතිවරයා විය යුතු අධ්‍යක්ෂවරයෙක් ;

(ආ) ආයතනයේ එක් එක් අධ්‍යයන සභාවේ සාමාජිකයන් අතරින් එම එක් එක් සභාවෙන් නම් කරනු ලබන එම එක් එක් අධ්‍යයන සභාවේ සාමාජිකයන් දෙදෙනෙක් ; එසේ නම් කරනු ලබන එක් සාමාජිකයෙක් එම සභාවේ සභාපතිවරයා විය යුතු ය ;

(ඇ) ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් නම් කරනු ලබන කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් අතරින් සාමාජිකයන් දෙදෙනෙකු, ඔවුන්ගෙන් එක් අයෙකු 8 වන නියමාවලියේ (ඇ) ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සාමාජිකයන් අතරින් අයෙකු විය යුතු ය ;

(ඈ) විශ්වවිද්‍යාලයේ සනාථන සභාව විසින් නම් කරනු ලබන තැනැත්තන් දෙදෙනෙකු, එම තැනැත්තන් විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු, මහාචාර්යවරු හෝ සහාය මහාචාර්යවරු වීම වඩා යෝග්‍යය ; සහ

(ඉ) ඉගැන්වීමේ නිරතව සිටින ආයතනයේ ස්ථිර ආචාර්යවරු අතරින් තෝරා පත්කරගත් සාමාජිකයන් දෙදෙනෙකු.

(2) අධ්‍යක්ෂවරයා, අධ්‍යයන සමායෝජන කමිටුවේ සභාපතිවරයා විය යුතු අතර, ඔහු එම කමිටුවේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. අධ්‍යක්ෂවරයා යම් රැස්වීමක මුලසුන දැරීමට අපොහොසත් වන්නේ නම්, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ රැස්වීමේ මුලසුන දැරීමට යම් සාමාජිකයකු තෝරාපත් කර ගනු ලැබිය යුතු ය.

(3) යම් නම් කරන ලද හෝ තෝරාපත් කර ගන්නා ලද සාමාජිකයකු කලින් ධුරය හිස්කරනු ලැබ ඇත්නම් මිස, ඔහුගේ පත් කිරීමේ හෝ නම් කිරීමේ දින සිට ගණන් ගැනෙන වසර තුනක කාලසීමාවක් සඳහා ධුර දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස නැවත නම් කිරීම සඳහා හෝ නැවත තෝරා පත්කර ගැනීම සඳහා සුදුසු විය යුතු ය.

එසේ වුව ද, යම් නම් කළ හෝ තෝරා පත්කරගත් සාමාජිකයකු ඔහුගේ කාලසීමාව ඉකුත්වීමට පෙරාතුව ස්වකීය ධුරය හිස්කර ඇත්නම්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින් කලින් ස්වකීය ධුරය හිස්කර ඇත්නම් මිස, තම පූර්වගාමියාගේ ධුරයේ නොගෙවී ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුරය දැරිය යුතු ය.

(4) ආයතනයේ අධ්‍යයන සමායෝජන කමිටුවේ යම් නම් කළ හෝ තෝරාපත් කර ගත් සාමාජිකයකු අධ්‍යක්ෂවරයා වෙත යොමුකරනු ලබන ලිඛිත ඉල්ලීමක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) නිවාඩු ලබා නොගෙන අධ්‍යයන සමායෝජන කමිටුවේ අනුක්‍රමික රැස්වීම් තුනකට සහභාගිවීමට අපොහොසත් වන, අධ්‍යයන සමායෝජන කමිටුවේ යම් නම් කළ හෝ තෝරාපත්කර ගත් සාමාජිකයකු, අධ්‍යයන සමායෝජන කමිටුවේ සාමාජිකයකු ලෙස ඔහුගේ ධුරය හිස් කර ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(6) අධ්‍යයන සමායෝජන කමිටුවේ සාමාජිකයන්ට කළමනාකරණ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමික හෝ දීමනා ගෙවනු ලැබිය යුතු ය.

(7) අධ්‍යයන සමායෝජන කමිටුව විසින් කළමනාකරණ මණ්ඩලයේ එකඟත්වය ඇතිව, විශේෂ කාර්යයක් සඳහා සහ විශේෂ කාලසීමාවක් වෙනුවෙන් එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් කමිටුවට සමාග්‍රහණය කරනු ලැබිය හැකි නමුත්, එසේ සමාග්‍රහණය කරන ලද යම් තැනැත්තකුට ඒ කමිටුවේ යම් රැස්වීමක දී ඡන්දයක් සඳහා ඉදිරිපත්වීමට හෝ ඡන්දය ප්‍රකාශ කිරීමට අයිතිවාසිකමක් නොතිබිය යුතු ය.

(8) අධ්‍යයන සමායෝජන කමිටුවේ රැස්වීමක් සඳහා වූ ගණපූර්ණය මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය. යම් ආකාරයකින් ඒ තුනෙන් එක පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන අවස්ථාවක දී, ඊළඟට පවතින වැඩිම පූර්ණ සංඛ්‍යාව ගණපූර්ණය විය යුතු ය.

(9) අධ්‍යයන සමායෝජන කමිටුව අවශ්‍ය ඕනෑම අවස්ථාවක රැස්විය හැකි නමුත්, එක් එක් වර්ෂයක දී වාර දහයකට නොඅඩු රැස්වීම් සංඛ්‍යාවක් පැවැත්විය යුතු ය.

(10) අධ්‍යක්ෂවරයා විසින්, අවශ්‍ය යැයි සිතන ඕනෑම අවස්ථාවක හෝ අධ්‍යයන සමායෝජන කමිටුවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සංඛ්‍යාවකගෙන් ලිඛිත ඉල්ලීමක් ඔහු වෙත ලැබුණු පසු, සතියක් තුළ අධ්‍යයන සමායෝජන කමිටුවේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

12. පනතේ, මේ නියමාවලියේ සහ වෙනත් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව අධ්‍යයන සමායෝජන කමිටුවට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :-

(අ) කළමනාකරණ මණ්ඩලය විසින් හෝ යම් අධ්‍යයන සභාවක් විසින් එය වෙත යොමු කරන ලද යම් කාරණයක් පිළිබඳ සලකා බැලීම සහ වාර්තා කිරීම ;

(ආ) අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩසටහන්, පුහුණු වැඩසටහන්, පර්යේෂණ වැඩසටහන් හෝ විභාගවලට සම්බන්ධ වන්නා වූ කාරණා සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලය වෙත නිර්දේශ කිරීම සහ වාර්තා කිරීම ;

(ඇ) අධ්‍යයන කාරණා පිළිබඳ සලකා බැලීමේ සහ වාර්තා කිරීමේ කාර්යය සඳහා අධ්‍යයන සමායෝජන කමිටුවේ සාමාජිකයන් නොවන තැනැත්තන්ගෙන් සමන්විත වන කමිටු පත් කිරීම ;

(ඈ) අනුමත අධ්‍යයන ක්ෂේත්‍රවල අතුරු ව්‍යවස්ථා මගින් නිශ්චිතව දක්වා ඇති විභාග සමත් වී ඇති සහ අතුරු ව්‍යවස්ථා මගින් නිශ්චිතව දක්වා ඇති වෙනත් කොන්දේසි සපුරන ලද මානව සම්පත් අභිවර්ධන ශාඛාවල උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය සඳහා යෝග්‍යවන තැනැත්තන් කළමනාකරණ මණ්ඩලයට නිර්දේශ කිරීම ;

(ඉ) කළමනාකරණ මණ්ඩලයට පහත දෑ නිර්දේශ කිරීම :-

(i) අධ්‍යයන පාඨමාලා සහ විභාගවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා වූ සුදුසුකම් ;

(ii) ආචාර්යවරුන් හෝ පරීක්ෂකවරුන් ලෙස පිළිගැනීම සඳහා සුදුසු තැනැත්තන් ;

(iii) අනුමත අධ්‍යයන ක්ෂේත්‍රවල අධ්‍යයන පාඨමාලා සහ විභාගවලට අදාළ අතුරු ව්‍යවස්ථා, නියෝග සහ රීති, එහි සලකා බැලීම සඳහා කෙටුම්පත් කිරීම ;

(iv) අධ්‍යයන සහා ප්‍රතිසංවිධානය කිරීම හෝ අලුත් අධ්‍යයන සහා සංවිධානය කිරීම සඳහා වූ යෝජනා ක්‍රම ;

(v) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා සුදුසු තැනැත්තන්ගේ නම් :

එසේ වුව ද, අදාළ අධ්‍යයන සභාව විමසීමෙන් තොරව යම් නිර්දේශයක්, කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් නොකළ යුතු ය ;

(ඊ) මේ නියමාවලියේ හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක අන්‍යාකාරයකින් විධිවිධාන සලසා නොමැති, අධ්‍යයන සමායෝජන කමිටුව වෙත පවරන ලද බලතලවලට ආනුෂංගික හෝ අමතර වශයෙන් වන වෙනත් යම් බලතල ක්‍රියාත්මක කිරීම :

එසේ වුව ද, යම් අධ්‍යයන කාරණාවකට අදළ යෝජනා සම්මතයක් සම්බන්ධයෙන් අදළ අධ්‍යයන සභාවට ප්‍රථමයෙන් සිය මතය අධ්‍යයන සමායෝජන කමිටුව වෙත වාර්තා කිරීමේ සහ සම්ප්‍රේෂණය කිරීමේ අවස්ථාව ලබා දී ඇත්නම් මිස, එවැනි යෝජනා සම්මතයක් අධ්‍යයන සමායෝජන කමිටුව විසින් සම්මත නොකළ යුතු ය.

එසේ වුව ද, තවදුරටත් එසේ සම්මත කරගත් යම් යෝජනා සම්මතයක් අවස්ථාවෝචිත පරිදි, පාලක සභාවේ, විශ්වවිද්‍යාල සනාථන සභාවේ සහ කළමනාකරණ මණ්ඩලයේ එකඟත්වය ඇතිව මිස ක්‍රියාත්මක නොකළ යුතු ය.

13. ආයතනය විසින්, අධ්‍යයන සමායෝජන කමිටුවේ, කළමනාකරණ මණ්ඩලයේ සහ විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ නිර්දේශය මත, කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද එක් එක් අධ්‍යයන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අධ්‍යයන සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

14. (1) එක් එක් අධ්‍යයන සභාවට, ඒ අධ්‍යයන සභාවේ පරිපාලන සහ ශාස්ත්‍රීය ප්‍රධානයා විය යුතු සභාපතිවරයකු සිටිය යුතු ය. ඔහු, එම ආයතනයේ ඉගැන්වීමේ නිරත ස්ථිර සේවයේ ආචාර්යවරු අතරින් කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු අතර, ඔහු එම අධ්‍යයන සභාවේ සාමාජිකයෙකු ද විය යුතු ය.

(2) එක් එක් අධ්‍යයන සභාවේ සභාපතිවරයා, පනතේ, මේ නියමාවලියේ සහ වෙනත් යම් උචිත සාධනපත්‍රයක විධිවිධානවලට යටත්ව ඔහුගේ පත්වීමේ දින සිට ගණන් ගැනෙන වසර තුනක කාල සීමාවක් සඳහා ධුර දැරිය යුතු අතර, කලින් ධුරයෙන් ඉවත්කර ඇත්නම් මිස, ඔහු නැවත පත් කිරීම සඳහා යෝග්‍ය වන්නේ ය.

(3) යම් සභාපතිවරයකු, නොපැමිණීම සඳහා නිවාඩු ලබා ගැනීම, රෝගාතුර වීම හෝ වෙනත් හේතුවක් නිසා මාස තුනකට නොවැඩි කාල සීමාවක් සඳහා සිය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක දී, අධ්‍යක්ෂවරයා විසින් ඒ කාල සීමාව සඳහා සභාපතිවරයාගේ තනතුරේ කටයුතු කිරීමට අදළ අධ්‍යයන සභාවේ වෙනත් ආචාර්යවරයකු පත් කරනු ලැබිය යුතු ය. එසේ වුව ද, සභාපතිවරයා විශ්‍රාම යන අවස්ථාවක දී, ඉල්ලා අස්වන අවස්ථාවක දී හෝ වෙනත් යම් හේතුවක් නිසා මාස තුනකට වැඩි කාල සීමාවක් සඳහා සිය ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, සභාපතිවරයාගේ තනතුර පුරප්පාඩු වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, අලුත් සභාපතිවරයකු (1) වන උප නියමාවලියට අනුකූලව පත්කරගනු ලැබිය යුතු ය. එසේ පත් කරගත් තැනැත්තා ඔහුගේ පූර්වගාමිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුර දැරිය යුතු ය.

15. (1) එක් එක් අධ්‍යයන සභාව -

(අ) සභාපතිවරයා ;

(ආ) අධ්‍යක්ෂවරයා ; සහ

(ඇ) ආයතනයේ අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයේ ඉගැන්වීමේ යෙදී සිටින අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයේ ආචාර්යවරු සහ අනෙක් කාර්යමණ්ඩලය අතුරින්, ආයතනයේ කළමනාකරණ මණ්ඩලය සහ අධ්‍යයන සමායෝජන කමිටුවේ එකඟත්වය ඇතිව අධ්‍යක්ෂවරයා විසින් නිර්දේශ කරන ලදුව, විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් පත්කරන ලද, සංඛ්‍යාවෙන් පහකට නොවැඩි තැනැත්තන්ගෙන්,

සමන්විත විය යුතු ය.

(2) යම් අධ්‍යයන සභාවක් විසින්, කළමනාකරණ මණ්ඩලයේ එකඟත්වය ඇතිව යම් විශේෂිත කාර්යයක් සඳහා සහ විශේෂිත කාලසීමාවක් සඳහා යම් සුදුසුකම්ලත් තැනැත්තකු ඒ සභාවට සමාග්‍රහණය කර ගත හැකි නමුත් එසේ සමාග්‍රහණය කර ගත් තැනැත්තෙකුට ඒ සභාවේ යම් රැස්වීමක දී ඡන්දයට ඉදිරිපත් වීමට හෝ ඡන්දය ප්‍රකාශ කිරීමට අයිතියක් නොතිබිය යුතු ය.

(3) 9 වන නියමාවලියේ (2) වන උප නියමාවලියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, යම් අධ්‍යයන සභාවක පත්කරන ලද එක් එක් සාමාජිකයාට සහ ඒ සාමාජිකයා සම්බන්ධයෙන් අදාළකර ගනු ලැබිය යුතු ය.

(4) එක් එක් අධ්‍යයන සභාවට, (1) වන උප නියමාවලියේ (ඇ) ඡේදය යටතේ ඒ සභාව විසින් එහි සාමාජිකයන් අතරින් තෝරාපත්කර ගනු ලැබිය යුතු ලේකම්වරයකු සිටිය යුතු ය.

(5) යම් අධ්‍යයන සභාවක රැස්වීමක් සඳහා ගණපූර්ණය, සමාග්‍රහණය කරන ලද සාමාජිකයන් ඇත්නම්, ඔවුන් බැහැර කරමින් අධ්‍යයන සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(6) එක් එක් අධ්‍යයන සභාව අවශ්‍ය ඕනෑම අවස්ථාවක රැස්විය යුතු අතර, එසේ වුව ද එක් එක් වර්ෂය තුළ දහයකට නොඅඩු රැස්වීම් වාර ප්‍රමාණයක් පැවැත්වෙන පරිදි රැස්විය යුතු ය.

16. පනතේ, මේ නියමාවලියේ සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව එක් එක් අධ්‍යයන සභාවට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :-

(අ) අධ්‍යයන සමායෝජන කමිටුව විසින් අධ්‍යයන සභාවට යොමු කරනු ලබන යම් කාරණා පිළිබඳ සලකා බැලීම සහ වාර්තා කිරීම ;

(ආ) ඒ අධ්‍යයන ක්ෂේත්‍රයේ අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩසටහන් සහ විභාග සම්බන්ධ සියලු කාරණා පිළිබඳ අධ්‍යයන සමායෝජන කමිටුවට නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම ;

(ඇ) යම් විශේෂ විෂයයන් පිළිබඳ සලකා බැලීමේ සහ වාර්තා කිරීමේ කාර්යය සඳහා අධ්‍යයන සභාවේ සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත් කමිටු පත් කිරීම ;

(ඈ) අධ්‍යයන පාඨමාලාවලට සහ විභාගවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා වූ අවශ්‍යතා අධ්‍යයන සමායෝජන කමිටුවට නිර්දේශ කිරීම;

(ඉ) ඒ අධ්‍යයන ක්ෂේත්‍රයෙහි අධ්‍යයන පාඨමාලා සහ විභාගවලට අදාළ නියෝග කෙටුම්පත් කිරීම සහ ඒවා අධ්‍යයන සමායෝජන කමිටුවට ඉදිරිපත් කිරීම;

(ඊ) ආචාර්යවරුන් සහ විභාග පරීක්ෂකයන් ලෙස පිළිගැනීම සඳහා සුදුසු තැනැත්තන් අධ්‍යයන සමායෝජන කමිටුවට නිර්දේශ කිරීම ;

(උ) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා වූ තරගවල පටිපාටි සහ කොන්දේසි අධ්‍යයන සමායෝජන කමිටුවට නිර්දේශ කිරීම;

(ඌ) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය සඳහා සුදුසු තැනැත්තන්ගේ නම් අධ්‍යයන සමායෝජන කමිටුවට නිර්දේශ කිරීම ;

(එ) අධ්‍යයන සමායෝජන කමිටුවට,

(i) පවතින අධ්‍යයන සභා ප්‍රතිසංවිධානය කිරීමේ සහ යම් අලුත් අධ්‍යයන සභා සංවිධානය කිරීමේ යෝජනා ක්‍රම ; සහ

(ii) අදාළ අධ්‍යයන සභාවලට අධ්‍යයන ක්ෂේත්‍ර පවරා දීම.

සම්බන්ධයෙන් නිර්දේශ කිරීම.

17. (1) ආයතනය විසින් සපයනු ලබන පාඨමාලා හෝ පාඨමාලා කොටස් පවත්වනු ලබන යම් උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධරයාගේ අනුමතය ඇතිව සහ කළමනාකරණ මණ්ඩලයේ සහ අධ්‍යයන සමායෝජන කමිටුවේ අනුමතය ඇතිව, එම උසස් අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් අතරින් සමායෝජකයෙකු පත් කිරීමට අධ්‍යක්ෂවරයාට බලය තිබිය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා විසින්, අධ්‍යයන සමායෝජන කමිටුවේ අනුමතය සහ කළමනාකරණ මණ්ඩලයේ එකඟත්වය ඇතිව, ආයතනය තුළ පවත්වන යම් පාඨමාලාවක් හෝ පාඨමාලාවක කොටසක් සඳහා, ආයතනයේ ආචාර්යවරයන් අතරින් හෝ කොළඹ

විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයන් වන, සහ ආයතනයේ බාහිර කථිකාචාර්යවරයන් ලෙස සේවය කරන ආචාර්යවරයන් අතරින් සමායෝජකයකු පත් කරනු ලැබිය යුතු ය.

(3) සමායෝජක අවස්ථාවෝචිත පරිදි, අදාළ අධ්‍යාපන ආයතනය හෝ ආයතනය තුළ ආයතනයේ ඉගැන්වීමේ වැඩසටහන් සහ විභාග සංවිධානය කිරීම සහ පරිපාලනය සඳහා වගකිව යුතු ය.

(4) එක් එක් සමායෝජකවරයා ඔහුගේ පත්වීමේ දින සිට ගණන් ගැනෙන වසර තුනක කාලසීමාවක් සඳහා ධුර දැරිය යුතු අතර, අධ්‍යක්ෂවරයා විසින් සිදුකරනු ලබන වාර්ෂික කාර්යසාධන සමාලෝචන මගින් වාර්තා කරන ලද දුර්වල කාර්යසාධනය හෝ වෙනත් යම් හේතුවක් නිසා ධුරයෙන් ඉවත් කරනු ලැබුවේ නම් මිස නැවත පත් කිරීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

(5) නොපැමිණීම සඳහා නිවාඩු ගැනීම, රෝගාතුරවීම හෝ වෙනත් කාරණයක් නිසා යම් සමායෝජකයකු මාසයකට නොවැඩි කාලසීමාවක් ඔහුගේ ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක දී ; සහ -

(අ) එම සමායෝජකවරයා (1) වන උපනියමාවලිය යටතේ පත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, අධ්‍යක්ෂවරයා විසින් එම උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ අනුමතය ඇතිව, එම උසස් අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් අතරින් සමායෝජකවරයකු පත් කරනු ලැබිය යුතු ය ; හෝ

(ආ) එම සමායෝජකවරයා (2) වන උපනියමාවලිය යටතේ පත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, අධ්‍යක්ෂවරයා විසින් අධ්‍යයන සමායෝජන කමිටුවේ අනුමතය ඇතිව කළමනාකරණ මණ්ඩලය විමසා, ආයතනයේ ආචාර්යවරයන් අතරින් හෝ කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයන් අතරින් හෝ කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයන් වන සහ ආයතනයේ බාහිර කථිකාචාර්යවරයන් ලෙස සේවය කරන ආචාර්යවරයන් අතරින් සමායෝජකයකු පත් කරනු ලැබිය යුතු ය.

(6) විශ්‍රාම යාම හෝ ඉල්ලා අස්වීම හෝ වෙනත් යම් හේතුවක් නිසා මාසයකට වැඩි කාල සීමාවක් සඳහා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට යම් සමායෝජකයකු අපොහොසත් වන අවස්ථාවක, සමායෝජක තනතුර පුරප්පාඩු වී ඇති බවට සලකනු ලැබිය යුතු අතර, (1) වන හෝ (2) වන උපනියමාවලියට අනුකූලව අවස්ථාවෝචිත පරිදි, වැඩබලන සමායෝජකයකු පත් කරනු ලැබිය යුතු ය.

18. ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

19. (1) ආයතනයට (මෙහි මින්මතු ''අරමුදල'' යනුවෙන් සඳහන් කරනු ලබන) මානව සම්පත් අභිවර්ධන ආයතන අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන, අරමුදලක් තිබිය යුතු අතර, ඊට -

(අ) යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව ආයතනයට ගෙවිය යුතු යම් ගාස්තුවක් ;

(ආ) මුදල් පරිත්‍යාගවලින් ලැබෙන යම් ආදායමක් ;

(ඇ) ආයතනයේ කාර්ය සඳහා පාර්ලිමේන්තුව විසින් සපයනු ලබන සහ ප්‍රදාන ලෙස සහ කොමිෂන් සභාව විසින් ගෙවනු ලබන යම් මුදල් ප්‍රමාණයක් ;

(ඈ) ආයතනයේ ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ව්‍යුත්පන්න වන සියලු ආදායම් ; සහ

(ඉ) කුමන හෝ මූලාශ්‍රයකින් ව්‍යුත්පන්න වූ ආයතනයට අයත් වෙනත් සියලු මුදල්.

ගෙවනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් මගින් ව්‍යුත්පන්න වන සියලු ආදායම් හැර, නිසි ආදායම් ශීර්ෂ යටතේ විග්‍රහ කරන ලද යම් නිශ්චිත මාසයක කාලයක් තුළ අරමුදලට ගෙවන ලද සියලු මුදල්වල සංක්ෂිප්තය එළඹෙන මාසය අවසාන වීමට පෙරාතුව අධ්‍යක්ෂවරයා විසින් කොමිෂන් සභාව වෙතට එහි දැන ගැනීම පිණිස ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

20. අධ්‍යක්ෂවරයාගේ කාර්ය පහත පරිදි විය යුතු ය :-

(අ) නියමාවලියෙන් නියම කරනු ලැබිය හැකි පරිදි වූ ආකෘතියකින් සහ ආකාරයකින් ආයතනයේ ගිණුම් පවත්වාගෙන යාම ;

(ආ) අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් ලබා ගැනීම සහ ඒ මුදල් නිසි ගිණුම් ශීර්ෂවලට බැර කිරීම ;

(ඇ) බලය දී ඇති සියලු ගෙවීම් සිදු කිරීම ; සහ

(ඇ) කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන්, කොමිෂන් සභාව විසින් නියම කරන ලද පරිදි යම් ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු සහ එළඹෙන වර්ෂයේ වාර්ෂික මූල්‍ය විසර්ජනයක් සකස් කිරීම.

එසේ වුව ද, යම් විශේෂිත කාර්ය සඳහා කරන ලද ප්‍රදානවලින් හෝ විශේෂිත අරමුණු සඳහා වූ පරිත්‍යාගවලින් ව්‍යුත්පන්න වන්නා වූ යම් ආදායමක් ආයතනයේ ගිණුම්වල වෙන් වෙන්ව ගිණුම්ගත කරනු ලැබිය යුතු අතර, ඒ ආදායමෙන් කිසිදු ගෙවීමක්, ආයතනයේ සාමාන්‍ය කාර්ය සඳහා හෝ ඒ ප්‍රදාන හෝ පරිත්‍යාග සිදු කරනු ලැබුවේ යම් කාර්ය හෝ අරමුණු සඳහා ද ඒ කාර්ය හෝ අරමුණු සඳහා හැර කිසිදු කාර්යයක් හෝ අරමුණක් සඳහා, නොකළ යුතු ය.

21. (1) ආයතනය විසින් එහි කටයුතුවලට අදාළව කොමිෂන් සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ යම් ආකෘතියකින් සහ ආකාරයකින් සහ නිශ්චය කරනු ලැබිය හැකි යම් තොරතුරු ඇතුළත් කරමින් ගිණුම් සහ සංඛ්‍යා දත්ත විස්තර ඇතුළත් වාර්ෂික ප්‍රකාශයක් සකස් කළ යුතු ය.

(2) ආයතනයේ ගිණුම් පොත් ආයතනයේ කාර්යාලයේ තැබිය යුතු ය.

22. උසස් අධ්‍යාපන ආයතනයක ගිණුම් විගණනය කිරීමට අදාළ, පනතේ XIII වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ආයතනයේ ගිණුම් විගණනය කිරීමට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

23. (1) ආයතනයේ කාර්ය මණ්ඩලය, එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ එකඟත්වය සහ කොමිෂන් සභාවේ අනුමතය ඇතිව අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි පරිදි වූ යම් නිලධරයන්ගෙන්, ආචාර්යවරුන්ගෙන් සහ වෙනත් සේවකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(2) ආයතනයේ කාර්ය මණ්ඩලය, අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලය විසින් ස්වකීය කාර්ය මණ්ඩලයෙන් මුදා හැරීම මත සපයනු ලැබිය යුතු හෝ, අධ්‍යක්ෂවරයාගේ ඉල්ලීම මත කළමනාකරණ මණ්ඩලයේ එකඟත්වය ඇතිව කොමිෂන් සභාව හෝ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. පනතේ X වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ආයතනයේ කාර්ය මණ්ඩලයේ පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

(3) ආයතනයේ සේවය සඳහා පූර්ණකාලීන පදනම මත විශ්වවිද්‍යාලයේ නිලධරයකු, ආචාර්යවරයකු හෝ වෙනත් සේවකයකු මුදා හරිනු ලැබ ඇති අවස්ථාවක දී, ආයතනය විසින් විශ්වවිද්‍යාලයේ දී ඔහු දරූ ඔහුගේ නිත්‍ය තනතුරේ වැටුප සහ දීමනා ඔහුට ගෙවනු ලැබිය යුතු ය. වෙනත් යම් අවස්ථාවක දී ආයතනය විසින් විශ්වවිද්‍යාලයේ පාලක සභාව විමසා සහ කොමිෂන් සභාවේ අනුමතය ඇතිව ආයතනය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ යම් දීමනා නිලධරයන්ට, ආචාර්යවරුන්ට හෝ වෙනත් සේවකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

(4) ආයතනයේ කාර්ය මණ්ඩලය, අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලයේ පාලක සභාව හෝ කොමිෂන් සභාවේ අනුමතය ඇතිව, අධ්‍යක්ෂවරයාගේ විධානය සහ විනය පාලනයට යටත් විය යුතු ය.

24. යම් තැනැත්තකු නිසි ආකාරයෙන් තෝරා පත් කරනු ලැබ, නම් කරනු ලැබ හෝ සමාග්‍රහණය කරගනු ලැබ තිබේ ද යන්න හෝ යම් තැනැත්තකු ආයතනයේ යම් අධිකාරයක හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක සාමාජිකයකු වීමට හිමිකම් ලබන්නේ ද යන්න පිළිබඳ යම් ප්‍රශ්නයක් පැන නැගේ නම් ඒ ප්‍රශ්නය, කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

25. ආයතනයේ යම් අධිකාරයක හෝ වෙනත් ඒකකයක කිසිදු ක්‍රියාවක්, යෝජනා සම්මතයක් හෝ නීති කෘත්‍යයක්, හුදෙක් එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ යම් සාමාජිකයකු පත් කිරීමේ දී යම් දෝෂයක් පැවතීම හේතුවෙන් අවලංගු නොවිය යුතු ය.

26. මෙම නියමාවලියේ -

''පනත'' යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ ;

''උචිත සාධන පත්‍රය'' යන්නෙන්, පනතේ විධිවිධානවලට අනුකූලව සාදන ලද යම් නියමයක්, නියමාවලියක් අතුරු ව්‍යවස්ථාවක්. නියෝගයක් හෝ රීතියක් අදහස් වේ ;

''අනුමත අධ්‍යයන ක්ෂේත්‍ර'' යන්නෙන්, ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන මානව සම්පත් අභිවර්ධනයේ පුහුණුවට හෝ අධ්‍යාපනයට අදාළ වන්නා වූ යම් අධ්‍යයන ක්ෂේත්‍රයක් අදහස් වේ ;

''මණ්ඩලය'' හෝ ''කළමනාකරණ මණ්ඩලය'' යන්නෙන්, මේ නියමාවලියේ විධිවිධාන යටතේ පිහිටුවනු ලබන කළමනාකරණ මණ්ඩලය අදහස් වේ ;

''කොමිෂන් සභාව'' යන්නෙන්, පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයේ සභාව අදහස් වේ ;

''පාලක සභාව'' යන්නෙන්, පනත යටතේ පිහිටුවන ලද කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාව අදහස් වේ ;

''උසස් අධ්‍යාපන ආයතනය'' යන්නෙන්, පනත යටතේ පිහිටුවනු ලැබ ඇති හෝ පිහිටුවන ලදැයි සලකනු ලබන යම් විශ්වවිද්‍යාලයක්, මණ්ඩපයක්, විවෘත විශ්වවිද්‍යාලයක්, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක්, උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් හෝ උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතනයක් අදහස් වේ ;

''ප්‍රධාන විධායක නිලධරයා'' යන්නෙන්,

(අ) විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් වන විට, ඒ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා අදහස් වේ ;

(ආ) විවෘත විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් වන විට, ඒ විවෘත විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා අදහස් වේ ; සහ

(ඇ) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් සම්බන්ධයෙන් වන විට, ඒ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා අදහස් වේ ;

''සනාථන සභාව'' යන්නෙන්, පනත යටතේ පිහිටුවන ලද කොළඹ විශ්වවිද්‍යාලයේ සනාථන සභාව අදහස් වේ ;

''ආචාර්යවරයා'' යන්නට, පනතේ ඒ සඳහා දී ඇති අර්ථය ම ඇත්තේ ය.

27. නියමාවලියේ අර්ථ නිරූපණයට අදාළ යම් ප්‍රශ්නයක් කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාව වෙත යොමු කරනු ලැබිය යුතු අතර, ඒ පිළිබඳව එම සභාවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

28. මෙම විධිවිධාන අර්ථ නිරූපණය කිරීමේ දී හෝ ආයතනය පරිපාලනය කිරීමේ දී හෝ මෙම නියමාවලියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් හෝ පැන නැගිය හැකි යම් දුෂ්කරතාවක් ඉවත් කිරීමේ කාර්ය සඳහා, ආයතනයේ අධ්‍යක්ෂවරයා විමසා, අවශ්‍ය හෝ යෝග්‍ය යැයි තමාට පෙනී යන පරිදි, මේ නියමාවලියේ විධිවිධානවලට පාදකව ඇති ප්‍රතිපත්තිවලට අනනුකූල නොවන යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ යම් විධානයක් කිරීමට උපකුලපතිවරයාට බලය ඇත්තේ ය.

29. 1979 දෙසැම්බර් මස 26 වන දින අංක 68/10 දරන අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද 1979 අංක 11 දරන සේවක අධ්‍යාපන ආයතන නියමාවලිය සහ 2021 පෙබරවාරි මස 02 වැනි දින අංක 2213/10 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2020 අංක 01 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලිය, එම නියමාවලි ඒ යටතේ කලින් සිදුකරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙයින් ඉවත් කරනු ලැබේ.

04-38

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.